Australian Government
Department of Home Affairs

# පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කිරීම

ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය සඳහා නව අයදුම්පත් භාර ගැනේ.

දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය සඳහා වන සියලුම අයදුම්පත් සැකසීම අඛණ්ඩව සිදු කෙරේ.

# පුරවැසිභාවය හා අදාළ හමුවීම් සහ පරීක්ෂණ

සෞඛ්‍ය මාර්ගෝපදේශ හා කලාපයේ පවතින සංචාරක සීමාවලට අනුකූලව සියලුම ප්‍රාන්තවල සහ දෙශභූමි සීමා තුළ පුරවැසිභාවය හා අදාළ තනි පුද්ගල හමුවීම් සිදු කෙරේ.

සුදුසුකම් ලත් පුද්ගලයින් සම්බන්ධ කර ගන්නා අතර පුරවැසිභාවය සඳහා වන හමුවීමකට හෝ පරීක්ෂණයකට සහභාගී වීමට ආරාධනා කෙරේ. ඔබේ පුරවැසිභාවය පිළිබඳ හමුවීම හෝ පරීක්ෂණය පිළිබඳව දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වීමට අවශ්‍ය නැත.

දේශීය COVID-19 අවදානම් සහ සීමා කිරීම් හේතුවෙන් පුරවැසිභාවය සඳහා වන හමුවීම්වලට බලපෑම් ඇති විය හැකිය. මෙම වාතාවරණය තුළ, කෙටි දැනුම් දීමකින් හමුවීම් අවලංගු කළ හැකි අතර, වාතාවාරණය යථා තත්ත්වයට පත්වී එය ආරක්ෂාව තහවුරු වන විට නැවත සකස් කර ගත හැකිය. කලාපීය COVID-19 අවදානම්වල සහ සීමාවල වෙනස්වීම් හේතුවෙන් බලපෑම් ඇති වූ හමුවීම් සැලසුම් පිළිබඳව දෙපාර්තමේන්තුව සේවාලාභීන්ට දැනුම් දෙයි. ඔබගේ ජංගම දුරකථනය සහ ඉ-තැපැල් සම්බන්ධතා විස්තර ඔබගේ ImmiAccount තුළ යාවත්කාලීනව ඇති බවට වග බලා ගන්න.

# පුරවැසිභාවය පිරිනමන උත්සව

ඔබව සෘජුවම සම්බන්ධ කර අන්තර්ජාලීය පුරවැසි උත්සවයකට සහභාගී වීමට ආරාධනා කරනු ලැබේ. ඔබගේ උත්සවය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව හෝ ඔබගේ පළාත් ආයතනය හා සම්බන්ධ වීමට අවශ්‍ය නැත. මෙම උත්සව රැස්වීම්වල සීමා සහ COVIDSafe අවශ්‍යතා පිළිබඳ වර්තමාන රාජ්‍ය හෝ දේශභූමි නියෝගවලට අනුකූල වේ.

සාමාන්‍යයෙන්, පුරවැසිභාවය ලබන අය ඔවුන්ගේ පුරවැසිභාවය අනුමත වූ බව දැන්වීමෙන් පසු පුරවැසිභාවය ලබාදෙන උත්සවවලට සහභාගී වී කැපවීමේ පොරොන්දුව ලබා දීම සඳහා මාස 12ක කාලයක් ඇත.